**අඹන්ගඟකෝර්ළේ ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අඹන්ගඟකෝර්ළේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අඹන්ගඟකෝර්ළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය  තත්ත්වය  සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල රු.53,436 ක ගෙවියයුතු වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පුවත්පත් මිලදී ගැනීම සඳහා වැයකළ රු.138,690 ක පුනරාවර්තන වියදමක් පුස්තකාල පොත් ගිණුමේ හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ප්‍රාග්ධන වියදමක් සේ ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ලංසු තැන්පත් එකතුව රු.18,000 ක් ආපසු ගෙවීමේදී ප්‍රාග්ධන වියදමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | -එම- | නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.59,000 ක මුද්දර ගාස්තු ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සළකා ගිණුම්ගත කර තිබුණි. | -එම- | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඉ) | අප්පල්ලාවෙල බෝක්කුව පාර සංවර්ධනය කිරීම සඳහා වූ ව්‍යාපෘතියට අදාලව මාර්ග සංවර්ධන අධිකාරියෙන් රු.100,000 ක මුදලක් ලැබියයුතුව තිබුණද, දෝෂ සහගතව රු.962,500 ක් ලැබියයුතු සේ ගිණුම්වල දක්වා තිබුණි. එසේම අතරැදි ලෙස රු.62,500 ක් ගෙවියයුතුව තිබුණද, රු.962,500 ක් ගෙවියයුතු සේ දෝෂ සහගතව දක්වා තිබුණි. මේ හේතුවෙන් ණයගැති රු.862,500 කින් හා ණයහිමියන් රු.900,000 ක් වැඩිපුර දක්වා තිබුණි. | -එම- | ගිණුම් නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු විගණන ගාස්තුව රු.164,400 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.100,000 ක් ලෙස රු.64,400 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

## 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,874,505 ක වත්කම් විෂයයන් 4 ක් සහ එකතුව රු.486,708 ක බැරකම් විෂයයන් 13 ක ස්ථාවර වත්කම් ලේඛන හා බැරකම්වලට අදාල ලිපිගොනු හා ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්තොයක්ෂණය කිරීමට නොහැකි විය. | තොරතුරු හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | එක් එක් ශේෂයන් තහවුරු කිරීම සඳහා ලේඛන හා ලිපිගොනු ඉදිරිපත් කළයුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු පනත් | | | |
| (i) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15(3) (ඇ) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන වාර්තාවෙහි ප්‍රාදේශීය සභාව ඉටුකර ගත් අරමුණු , අනාගත අපේක්ෂා , ප්‍රධාන කාර්යසාධන දර්ශක හා සම්පත් භාවිතා කිරීම සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කර නොතිබුණි . | කාර්ය සාධන වාර්තාවෙහි අදාළ කරුණු ඇතුළත් කර ඉදිරිපත් කර ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |
| (ii) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (a) 152(1) වගන්තිය | සභාබල ප්‍රදේශය තුළ ස්ථාපනය කර තිබූ දුරකථන කුළුණු 2 කින් රු.12,000 ක ව්‍යාපාරික බදු ආදායමක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | පනතේ විධිවිධාන අනුගමනය කළයුතුය. |
| | (b) 150 (1) වගන්තිය | වෙළඳ බලපත්‍ර සමීක්ෂණයෙන් හඳුනාගත් ව්‍යාපාර 60 කින් අයවියයුතු රු.56,000 ක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් නොගෙවූ ව්‍යාපාර නවතා ඇති බවට ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි සහතික කොට ලිපි ඉදිරිපත් කර ඇති බව. | විෂයයට අදාල ක්ෂේත්‍ර නිලධාරීන් විසින් සමීක්ෂණයක් සිදුකර එම වාර්තාව මඟින් ව්‍යාපාරයක් නොමැති බවට තහවුරු කර ගැනීම සිදුකළ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | යුතුය. |
| (ආ) | රීති<br><br>1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන ) රීති 218 | 2017 දෙසැම්බර් 31 දිනෙන් පසුව ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ සමීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින බව. | රීති ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br><br>2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාව සතු ධාවන තත්ත්වයේ පවතින වාහන 08ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත කාලය තුළ ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකරන බව. | චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු සිදුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.150,398 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.1,932,057 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 147,500 | 7,914 | 7,139 | 8,706 | 122,500 | 96,901 | 94,493 | 7,932 |
| (ii) | කුලී | 357,400 | 245,320 | 255,529 | 29,935 | 349,900 | 229,749 | 207,090 | 40,144 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 245,100 | 293,900 | 293,900 | - | 275,000 | 324,550 | 324,550 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,400,000 | 1,626,705 | 1,502,976 | 808,683 | 1,400,000 | 1,517,517 | 1,441,650 | 684,954 |
| | එකතුව | 2,150,000 | 2,173,839 | 2,059,544 | 847,324 | 2,147,400 | 2,168,717 | 2,067,783 | 733,030 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල පාරිභෝගිකයින්ගේ තොරතුරු හා ජල ගාස්තු ගෙවීම් පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වා නොගැනීමත්, හිඟ ජල ගාස්තු අයකිරීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමීව සිදුවීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල යෝජනා ක්‍රම 08 කට අදාලව රු.808,183 ක හිඟයක් අයකරගෙන නොතිබුණි. | තොරතුරු පරිගණක ගතකර හිඟ ජල ගාස්තු අයකර ගනිමින් පවතින බව. | හිඟ ආදායම් අයකළ යුතුය . |
| (ආ) | ජල යෝජනා ක්‍රම 07 ක ජල සම්බන්ධතාවය විසන්ධි කළ පාරිභෝගිකයින් 34 කගෙන් රු.71,665 ක හිඟ ශේෂයක් අයකරගෙන නොතිබුණි | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුය. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබුණු උසාවි දඩ රු.195,248 ක් හා මුද්දර ගාස්තු රු.676,400 ක් විය. | තවදුරටත් අයවියයුතු මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | ලැබියයුතු මුදල් ගෙන්වා ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 4 ක එකතුව රු.20,658,385 ක් විය. | ලැබියයුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.20,116,548 ක් විය. | ගෙවිය යුතු ශේෂයන් ගෙවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වසර 4 ක කාලය තුළ ගොඩනැඟිලි සංවර්ධන බලපත්‍ර අයදුම්පත් 130ක් ලැබී තිබුණු අතර, ඉන් අයදුම්පත්‍ර 56 ක් සඳහා ගොඩනැඟිලි සංවර්ධන බලපත්‍ර නිකුත් කර තිබුණි. ඉන් සංවර්ධන බලපත්‍ර 53 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | වෙනත් ආයතන වෙතින් ලබා ගන්නා නිර්දේශ මත අනුකූලතා සහතික නිකුත් කිරීම රඳා පවතින බැවින් කාල ප්‍රමාදයන් පවතින බව. | අනුකූලතා සහතික නිකුත් කළ යුතුය. |
| (ආ) | විධිමත් අනුමැතියකින් තොරව හා ගිවිසුම්ගතවීමකින් තොරව අවිධිමත්ව රු.2,000 ක මාසික කුලියක් නියමකර සභාව සතු පැරණි පුස්තකාල කාමරය රත්තොට විවිධ සේවා සමූපකාර සමිතියට 2021 පෙබරවාරි 10 දින ලබාදී තිබුණද, එදින සිට | තවදුරටත් අයවියයුතු මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | විධිමත්ව ගිවිසුම්ගත වී බදු පවරා ගාස්තු අයකළ යුතුය. |

සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.46,000 ක් අයකරගෙන නොතිබුණි.

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.10,799,319 ක වාහන , යන්ත්‍රෝපකරණ හා උපකරණ 07 ක් වසර 2 ත් 17 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි . | එක් එක් වත්කම් සම්බන්ධව සුදුසු පරිදි කටයුතු සිදුකරන බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමටත් අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු.52,250 ක ඉඩම් 15 ක හා වටිනාකම හඳුනා නොගත් ඉඩම් 38ක අයිතිය පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | 2018 ජූලි 28 දින පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.1,319,050 ක් වටිනා මහේන්ද්‍රා කැබ් රථයේ අයිතිය පවරාගෙන නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | අයිතිය පවරා ගතයුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව හා සැසඳීමේදී තනතුරු 08 ක පුරප්පාඩු 12 ක් හා එක් තනතුරක අතිරික්තයක් පැවතුණි . | ආයතනගත තනතුරු වලට බඳවා ගැනීම් සියල්ල මේ වන විට අත්හිටුවා ඇති බව. | අනුමත කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාමට කටයුතු කළයුතුයි. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 05 කට අදාළ රු.2,016,000 ක ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් අයකර ගෙන නොතිබුණි. ආදායම් විෂයයන් 12 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම් අතර සියයට 24 සිට සියයට 150 දක්වා පරාසයක විචලනයක් පැවැති අතර වැය විෂයයන් 7 ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 70 සිට සියයට 97 දක්වා පරාසයක විචලනයක් පැවතුණි. | මේ සම්බන්ධව ඉදිරියේදී කටයුතු සිදු කරන බව. | අවශ්‍යතාවය සළකා බලා අවධානයෙන් අයවැය පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය . |